# මහපොළ නිර්මාතෘවරයා ගමන් මග හෙළිකරයි

මෙරටේ උසස් අධ්‍යාපනයේත්, වෙළෙඳ රටාවේත් නව ජයග්‍රහණ රාශියක් හිමි කරගෙන තිබෙන, අනාගතයේදී තවත් ජයග්‍රහණ රාශියක් ලබාගන්නා බවට පොදුජන විශ්වාසය දිනා ඇති 'මහපොළ' සංකල්පය පිළිබඳව එහි නිර්-මාතෘවරයාගෙන් කරුණු විමසීමේ දුලබ අවස්ථාවක් 'ගොවි ජනතාව' සංස්කාරක මංඩලයට පසුගියද ලැබුණා. අපේ ජාතියේ ඉරණම විසඳීම පිළිබඳව ඉතා වැදගත් සේවාවක නිරත වෙමින් වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම අතිශය කාර්ය බහුල ජීවිතයක් ගෙවන ජාතික ආරක්ෂක අමාත්‍ය ජනාධිපති නීතිඥ ලලිත් ඇතුලත්මුදලි මහතා, අප නියෝජිතයන් සමඟ සාකච්ඡා කළේ සිය නිසඟ ගුණයන් වන සුහදතාවය හා නිහතමානීත්වය උතුරා යවමින්. පහත පළවන්නේ එම සාකච්ඡාවයි.

**ප්‍රශ්නය:**

දුන් ඇල්පිටියේදී පැවැත්වෙන මහපොල 100 වැනි සංවත්සරය, එම සංකල්පයේ නිර්මාතෘවරයා ලෙස ඔබ අගය කරන්නේ කෙසේද?

**පිළිතුර:**


මෙම උත්සවය කරුණු තුනකින් වැදගත් ලෙස සැළකිය හැකියි. පළමුවැන්න මෙය මේම ව්‍යාපාර යට පස් වසරක් සම්පූර්ණවීම, දෙවැන්න සියවන මහපොළ. තුන්වැනි කරුණු නම් මේ වර්ෂයේ දී අපට හැකිවී තිබෙනවා. මෙරටේ විශ්ව විද්‍යාල වලට ඇතුළත් වෙන සිසුන්ගෙන් භාගයකටත් වඩා මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට මේ උත්සවයේ තවත් වැදගත් කරුණක් නම් අපි පළමු වෙන්ම මහපොල ආරම්භ කළ ගාලු දිස්ත්‍රික්කයේම මෙම උත්සවයත් පවත්වන්නට හැකිවීම මං හිතනවා දකුණු පළාතෙත් මෙම ව්‍යාපාරය ආරම්භ කිරීම අපි ලබාගත් ජයග්‍රහණවලට හේතුවුනා කියල.

**ප්‍රශ්නය :**

ඇමති තුමනි, මහපොළ ආරම්භ කොට අවුරුදු 5 ක් ගතවන මේ මොහොතේ ඔබෙන් දැනගන්ට කැමතියි මහපොල සංකල්පය ඔබේ සිත් තුල ඇති වුනේ මොන අදහසක් නිසාද කියල.

**පිළිතුර:**

මහපොල පටන් ගත්තේ අලුත් ආර්ථික ක්‍රමය මහජනයාට පැහැදිලි කරන්ටයි අපට පෙනුනා, 77,78 79 යන වසංවල රටවටා යන කොට අලුත් ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කොහොමද කියලා, නව ක්‍රමයේ ප්‍රතිඵල ලබා ගන්නෙ කොහොමද කියන එක වෙළඳාමට සම්බන්ධ වෙළඳුන්ටත්, පාරිභෝගිකයින්ටත් වැඩි අවබෝධ යක් තිබුනෙ නැහැ. තරඟකාරීත්වය, බඩු සුලභවීම තේරීමේ අයිතිය හාරිභෝගිකයා ආරක්ෂා කරන්නෙ කොහොමද? ඔය වගේ විවිධ ප්‍රශ්නවලට වැඩි අවබෝධයක් නැති බව මට පෙනුනා. ඒකත් ස්වභාවිකයි කියලා මට තේරුනා. මොකද අවු: 20,25 වෙනත් ආර්ථික ක්‍රමයක් මේ රටේ තිබුනේ. ඉස්සෙල්ලා ගමේම ගිහිල්ලා එය අවබෝධ කරන්න



නිර්මාතෘවරයා අතින් ශිෂ්‍යත්වයක් පිරිනැමේ

ඕනෑයි කියන ක්‍රමයම තමයි අපි කල්පනා කළේ. එතනින් කල්පනා නොකළ විදියට අපි අධ්‍යාපනයට සම්බන්ධ වුනා. එකත් සම්බන්ධ වුණේ ගමක මේ වගේ උත්සවයක් තියන්න වෙන තැනක් නෑ ඉස්කොලේ ඇර, මේ ඉස්කෝලේට ගියාම, එතනදී අපිට මුදල් එකතු වුනා. ඒ මුදල් මොකකට හරි පාවිච්චි කරන්න ඕනේ. වෙළඳ අමාත්‍යාංශයට ඒ මුදල් ගැනීම හරි නෑ කියලා මං ඒක තීරණය කළා. ඒක නිසා අපි ඒක ඒ පාසැලට, ඒ ආසනයට ප්‍රයෝජනය සඳහා පාවිච්චි කෙරුවා.

ප්‍රශ්නය :

දැන් මේ විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වැදගත්කම ඔබේ සිත්තුලට ආවේ මොන හේතුවක් නිසාද? මහපොල තුලින්.

පිළිතුරු:

ඒකත් මහපොල අධ්‍යාපනයට සම්බන්ධවුනාට පස්සේ. අධ්‍යාපනයයි වෙළඳාමයි එකට යාමේ ප්‍රයෝජනයත් පෙනුනට පස්සේ මං දනගෙන හිටියා මේ රටේ නිදහස් අධ්‍යාපනය සම්පූර්ණ කරන්ට ඇතැම් ඉඩ තියෙනවා කියලා. ඒකත් ජනාධිපතිතුමා නොමිලේ පාසල් පොත් දීමේ පරම යෝජනාව මේ රජයට ක්‍රියාත්මක කරන්ට පුළුවන් වුනා, එතකොට උසස් අධ්‍යාපනය ලබා ගත්තේ මේ රටේ තෝරපු වස්තුවක් හැටියට මං කල්පනා කෙරුවේ. ඒ අයට ඉගෙන ගන්ට ආර්ථික ප්‍රශ්න තියෙනව නම් කවදාක්වත් මනස සම්පූර්ණයෙන්ම ඉගෙනීමට යොදන්ට අමාරුයි. මං දැකලා තියෙනවා, මං අහලා තියෙනවා, මං අත්හද බලලත් තියෙනවා ආර්ථික ප්‍රශ්න අධ්‍යාපනයේ උපරිම ජයග්‍රහණ ලබාගන්ට අපහසුව් තියෙනවා. ඉතින් ඒවා මහ හරින්ට තමයි අපි මේ ශිෂ්‍යත්ව ක්‍රමය ආරම්භ කෙරුවේ.

ප්‍රශ්නය:

දැන් මහපොල ශිෂ්‍යත්ව ක්‍රමයට අමතරව මහපොල තුලින් තවත් අධ්‍යාපන වැඩ සටහන් කීපයක් ක්‍රියාත්මක වෙනවා නේද?

පිළිතුර : ඔව්.

ඊට පස්සේ සමහරු ඇවිල්ලා මට කිව්වා උසස් අධ්‍යාපනයේ විශ්ව විද්‍යාලයට යන අයට උදව් කරනවා මහපොළෙන්. කොහොමද විශ්ව විද්‍යාලයට නොයන අයට උදව් කරන්නේ කියලා. එකෙන් පටන් ගත්තා පිළිවෙලවල් දෙකක්. එකකට කියනවා මහපොළ ඥාණ ප්‍රදීප කියලා. එකත් කල්පනා වුනේ උසස් පෙළ විභාගවලට ඉන්න අය ගැන. මේ රටේ තියෙනව විද්‍යාගාර, පුස්තකාල පහසුකම

# ගමින් ගමට ඥානප්‍රදීපය

තිබෙන හොඳ ඉස්කෝලවල් 373 ක් විතර. නමුත් උසස් පෙළ විභාගවලට ළමයි ඉදිරිපත් කරනතවත් පාසැල් 1300 ක් පමණ තියෙනවා, ඒ පහසුකම් තාම මදි කියලා කල්පනා කරන ඒවා. එම නිසා විශ්ව විද්‍යාලවලට ඇතුල් වෙන්ට තරඟ කරන ළමයින්ට එක හා සමාන පදනමක් උඩ තරඟ කරන්ට එසට පහසුකම් තාම හැඩ ගැහිලා නැහැ. ආණ්ඩුවෙන් හුඟක් වැඩ කරලා තියෙනවා. මේ මෑත කාලයේදී අධ්‍යාපන අමාත්‍යාංශයත්. අධ්‍යාපන සේවා අමාත්‍යාංශය හුඟාක් වැඩ කරලා තියෙනවා. නමුත් ස්වේච්ඡාවෙන් ඒ ඉන්න ළමයින්ගේ උදව් වෙනුත් මහපොළෙනුත් මේ වැඩ කොටසක් ටිකක් කලක් කාටවත් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. උදව් වක් හැටියට. මේක භාර අමාත්‍යාංශ අපේ සෑම සහයෝගයක්ම දෙනවා. ඉතින් ඒක පටන් ගෙන තියෙනවා පුස්තකාල හා විද්‍යාගාර සකස් කිරීම. දැනට එකක් දෙකක් හදගෙන යනවා. ඇත්ත වශයෙන්ම නිල වශයෙන් විවෘත කරන පළවෙනි එක විවෘත කරන්නේ 10 වෙනිද. දෙවෙනි එක තමයි "ඥාන දර්ශණ" කියන එක. ඒක සම්මන්ත්‍රණ මාලයක්. එක කෙළින්ම උසස් පෙළ විභාග වලට වාණිජ්‍යයට සම්බන්ධ විෂයයන් ඉගෙන ගන්නා අයට වාණිජ්‍ය ගැන ඊටත් වඩා ගැඹුරු අවබෝධයක් ලබාදීමට කරනා සම්මන්ත්‍රණයක්. ඒ විශේෂ ලක්ෂණය මම බොහොම සන්තෝෂවෙන කාරණයක් තමයි: මමත් ගිහිල්ලා ඒ සම්මන්ත්‍රණ යට සහභාගිවෙනවා. එතකොට ඒ ළමයින්ට මගෙන් ප්‍රශ්න අහන්ට මම සකස් කරනවා. අවස්ථාව දෙනවා. එකෙන් මටත් යම්කිසි දෙයක් ඉගෙන ගන්න පුළුවන්. මොකද තරුණ පරපුර කල්පනා කරන්නේ කොහොමද? විග්‍රහ කරන්නේ කොහොමද? විග්‍රහ කරන්නේ කොහොමද? ඒවා අහලා තමයි මම විශ්වාස කරන්නේ මේ රටට විශාල අනාගතයක් තියෙනවා කියලා. එදට වඩා දක්ෂමක් තියෙන, අවබෝධයක් තියෙන, විග්‍රහ ශක්තියක් තියෙන, ප්‍රශ්න තේරුම් ගන්ට පුළුවන් තරුණ පරපුරක් මේ ලංකාවේ අද ඉන්නවා. ඒ නිසා මම විශ්වාස කරනවා ඉබේම පම්පෝරියට, සටන් පාඨයට, ප්‍රචාරයට විවේචනාත්මක සැලකිල්ලක් නැතිව යම් දෙයක් පිළිගන්නා රටක් නෙවි අපේ අනාගතයේ තියෙන්නේ. හැම දෙයක්ම කල්පනා කරන්න. විග්‍රහ කරන්න. තේරුම් ගන්න, පුළුවන් තරුණ පරපුරක් ඇති සමාජයකට තමයි අපි දැන් පාතබන්නේ

ප්‍රශ්නය :

දැන් මේ වෙළඳාම හා අධ්‍යාපන එකට යොවුනු විෂයසන් දෙක එකට සම්බන්ධ කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබෙනවයි කියලා ඔබට හිතන්න පුළුවන්ද?

පිළිතුර :

මට හිතන්න පුළුවන්, නමුත් මට වඩා හිතන්න ඕන මහජනයා. මම මේකේ මහජනයාගේ තීන්දුවයි පිළිගන්නේ. මගේ අදහසටත් වඩා මහජනයාගේ තීරණය තමයි අවශ්‍යය. දැන් පෙනෙන විදියට මහජනයා ඒකට කැමතියි. මහාපොළට එනවා කවදක්වත් හිතපු නැති සංඛ්‍යාවක්. දැනට මහ පොලවල් 99 ක් තියලා තියෙනවා. මං හිතන්නේ මහපොළට දැනට කෝටියක් පමණ දෙනා සහභාගි වෙලා තියෙනවා. ශීඝ්‍රත්ව තියෙනවා දනට මේ



මහපොල ටිකට් පත් විකිණීමට ල...
ඇතුලත්මුදලි මහතාද සම්බන්ධ වේ.
මේ අධ්‍යාපන ඇමතිවරයාට ටික...
පතක් විකුණූ අවස්ථාවක්

3000 දුන්නම 7000 කට ආසන්න සංඛ්‍යාවක්. මහ මහ පොළ ලොතරැයි එකිනෙනවා හිතපු නැති විදියට. මං දන්නව හුඟක් දෙනෙක් ඒ ලොතරැයි ගත්තෙ නිකං පරිත්‍යාගයකට. මහපොල ලොතරැයිය දිනන අය, කොටසක් ඒ දිනුමෙන් කොටසක් අපිට ආපහු නෙත් දෙනවා. තෑගලක් වශයෙන්. නොයෙක් අය පරිත්‍යාග කරනවා. සමහර අය සුලු මුදල් පරිත්‍යාග කරනවා. දැන් මහපොල කියන එක වැඩිය ප්‍රචාරය කරන්න ඕනෙත් නැහැ. මෙක නිකම්ම මහජනයාගේ හිත්තුල රැදීලා තියෙනවා මගේ අදහස මෙක මහජනයාගෙ ව්‍යාපාරයක්, මගේ එකක් නෙවි මෙක මම පටන්ගත්තා. මෙක නිකං උදව් කෙරුවා විතරයි. ඒක මට වඩා ලොකු දෙයක්.

ප්‍රශ්නය:

දැන් පස්වන සංවත්සරයෙන් පස්සෙ අනාගතයේදී මහපොල පැවැත්වීම තව තවත් ගම්බද ප්‍රදේශ වලට ව්‍යාප්ත කරගෙන යනවද?

පිළිතුර:

කරගෙන යනවා. අපි දැන් ආසන අනු ගණනකට මහපොල ගෙන ගොස් තියෙනවා. මේ ලංකාවේ තව ආසන 78 ක් තියෙනවා. ඉතුරුවෙලා. ගම්බද ආසනම තව 55 ක් විතර තිවෙනවා. නමුත් දැන් ප්‍රශ්නෙ වෙලා තියෙන්නෙ මහපොළ මීට ඉස්සෙල්ලා තියපු ආසනෙත් දැන් නැවත වරක් ඇවිල්ලා තියන්න කියනවා. මොකද තව මහපොලක් තිබුනොත් අධ්‍යාපන කටයුතුවලට ඒ ස්ථාන ලක්ෂ 2, 3 ක් එකතු වෙනවා. එක මහපොල ශිෂ්‍යත්ව නෙවි. එක මහපොලින් සමහර වෙලාවට මට හිතෙනව, මේ මහපොළට වඩා ඒ මහපොල ශිෂ්‍යත්ව කීර්තිමත්වෙලා කියලා.

ප්‍රශ්නය:

දැන් මේ මහපොලින් එකතුවෙන මුදල්වලින් තමයි ඒ ඒ ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු කරන්නේ මං හිතන්නෙ ලබන වසරේ ශිෂ්‍යත්ව 3000 ක් දෙන්න බලාපොරොත්තු වෙනවා.

පිළිතුර:

මේ සැරේ ලොතරැයියේ ප්‍රතිඵල බලලා ඔක්කොම බලලා මං ගණනක් සඳහන් කරන්නම කොහොමත් 3000 ට වැඩියෙන් දෙන්න පුළුවන් වේවි. වාසනාව තියෙනනෙ අර 1981 දුන්න 423 ගණන නැවත වරක් ප්‍රදානය කරන්න අවස්ථාව ලැබෙනවා. මොකද ඒ අපි ප්‍රාර්ථනා කරනවා ඒ අය මේ වසරේ උපාධිධාරින් වෙයි කියලා.

ප්‍රශ්නය:

සමහර දෙනාගේ යම් යම් අදහස් තියෙනවා කියලා අපට දැනගන්ට ලැබුනා. මේ මහපොල ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේදී දේශපාලන බලපෑම් සිදු වෙනවයි කියලා.

පිළිතුර:

නෑ නෑ ඔක්කොම ලකුණුවලින් එන්නේ ශිෂ්‍යත්ව දෙන ප්‍රමාණයෙන් 10% ක් දෙන්නෙ කුසලතා අනුවයි. 90% ක් දෙන්මේ කුසලතාවය අවශ්‍යතාවය අනුවයි. දෙවෙනි වර්ගය සොයන්නේ අර බැංකු ණයවලට සුදුසුකම් තියෙන අය අරගෙන ඒ අයගේ ලකුණු බලලා ඒ අයගේ විෂයයන් වර්ග කරලා එහෙමයි දෙන්නේ. හැම පළාතටම ලැබෙන විදියටත් අපි දෙනවා. අපි දේශපාලන පක්ෂයක් අහන්නෙත් නෑ. මහපොල මණ්ඩලයේ නිත්‍යානුකූල පණතක් ගෙනල්ලා තියෙන්නෙ. අග්‍ර විනිශ්චයකාරතුමා තමයි ඒකෙ සභාපති. ඒකෙ ඔක්කොම ඉන්නේ දේශපාලනයට සම්බන්ධ නැති අය. එක් කෙනෙක් විතරයි දේශපාලනයට සම්බන්ධවෙලා තියෙන්නේ. ඒ මම විතරයි.

ප්‍රශ්නය:

මහපොල ශිෂ්‍යත්ව ලබන අපේ සරසවි උපාධිධාරින්ටත් ඒ වගේම පොදුවේ අපේ රටේ ශිෂ්‍ය පරපුරටත් මේ වැදගත් අවස්ථාවේදී ඔබතුමාට දෙන්න පණිවිඩයක් තියෙනවාද?

පිළිතුර:

මගේ පණිවිඩය නම් රට වෙනුවෙන් තමන්ගෙ නුවන තබනවයි කියන අධිෂ්ඨාන තහවුරු කරගන්ටයි කියලා. රටක් හදනවයි කියන එක තනි පුද්ගලයෙකුට කරන්න බැහැ. කොච්චර හොඳ ශ්‍රේෂ්ඨ උතුම්. අවංක පුද්ගලයෙක් වුනත් රටක් හදන්ට මුලු ජනතාවම ඒ විදියට බලන්න ඕනේ. මේ රටේ ජනතාවට ඥානය තියෙනවා. අවස්ථාව පැදූනහම මහන්සිවෙලා වෙහෙසවෙලා වැඩකරන්ට හැකියාව තිබෙන බව මම පිළිගන්නවා. අපිට ඕන කැපවීමයි සංවිධාන ශක්තියයි. කාටවත් විශේෂයෙන් විදේශියයන්ට කවදක්වත් උකස් තියන්ට එපා. පොත් පත් කියවුනත්, පොතේ තිබුන දෙයක් වුනත්. සඳෙසියක ලියලතිබුන දෙයක් වුනත් ඒක විග්‍රහ ශක්තියක් ඇතිව කියවන්ට. එහෙම කරගත්තොත් මේ රටේ අනාගතය බොහොම සාර්ථක වෙයි කියල මං ප්‍රාර්ථනා කරනවා. අපි ආදයමෙන් තුන්වෙනි ලෝකෙ රටක්. අනික් දේවලින් ඊට වඩා දියුණු රටක් ඒක නිසා අපි හැම අතින්ම මේ ලෝකේ දියුණුවන රටක් හැටියට අපිට මේ ඉදිරි අවු: 10,20 යනට පුළුවන් කියලා මං විශ්වාස කරනවා. ඒකට තමයි සහයෝගය ඕනේ.